# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2376/26 – 2024 මාර්තු මස 21 වැනි බ්‍රහස්පතින්දා – 2024.03.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.-බී. 13/1978 (IV)

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

24 වන ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාව යටතේ සාදන ලද විධානය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 24 වන ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාව මගින් අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අමාත්‍ය මණ්ඩලයේ එකඟත්වය ඇතිව, මෙම විධානය මගින් මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අධිකරණවල නඩු වාර්තා හෝ නඩු කටයුතුවල දී හෝ නඩු වාර්තා හෝ නඩු කටයුතු සම්බන්ධයෙන් සියලු කාර්ය සඳහා ඉංග්‍රීසි භාෂාව භාවිත කිරීමට අවසර දෙනු ලැබේ.

**ආචාර්ය විජයදාස රාජපක්ෂ,**
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2024 ක් වූ මාර්තු මස 19 වැනි දින,
කොළඹ දී ය.

1A – G 41628 – 14 (2024/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

1. 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන අනුව අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණය.

2. 1983 අංක 40 දරන අද්මිරාල්ති අධිකරණ බලය පනතේ විධිවිධාන අනුව අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය.

3. 1995 අංක 11 දරන බේරුම් කිරීමේ පනතේ විධිවිධාන අනුව අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය.

EOG 03 – 0166

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.